# 2021 මාර්තු 31වන දිනෙන්

## අවසන් වූ මුදල් වර්ෂය සඳහා

# බීසීසී ලංකා ලිමිටඩ්

# වාර්ෂික වාර්තාව

# පටුන


01. ආයතනික තොරතුරු ........................................ iv

02. අපගේ දැක්ම හා මෙහෙවර ........................................ v

03. සභාපතිවරයාගේ සමාලෝචනය ........................................ vi

04. අධ්‍යක්‍ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ........................................ vii

05. සංවිධානය පිළිබඳව ........................................ viii

06. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව ........................................ ix

07. ස්වාධීන විගණක වාර්තාව ........................................ xi

07. මූල්‍ය වාර්තාව

ආදායම් ප්‍රකාශය ........................................ 1

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........................................ 2

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය ........................................ 3

මුදල් ප්‍රවාහය ........................................ 4

මූල්‍ය තොරතුරු සඳහා වූ සටහන් ........................................ 5-24

# **බී.සී.සී. ලංකා සමාගම-පී.බී. 221**

## ආයතනික තොරතුරු

| | | |
|---|---|---|
| **සමාගමේ නම** | **-** | **බී.සී.සී. ලංකා සමාගම** |
| **සමාගමේ ලියාපදිංචි අංකය** | **-** | පී.බී. 221 |
| **ලියාපදිංචි කාර්යාලය** | **-** | **හල්ස්ඩොර්ෆ් මිල්ස්, අංක 21,**<br>මීරානියා වීදිය,<br>කොළඹ12. |
| **ව්‍යාපාරික ලිපිනය** | **-** | **හල්ස්ඩොර්ෆ් මිල්ස්, අංක 21,**<br>මීරානියා වීදිය,<br>කොළඹ12.<br>දුරකථනය: 011-2422111-5<br>විද්‍යුත් තැපැල:bcclankaltd@gmail.com |
| **අධ්‍යක්ෂක මණ්ඩලය** | **-** | **2021/03/31 දිනට අධ්‍යක්‍ෂක මණ්ඩලය පහත පරිදි වේ.**<br>ඩබ්ලිව්.එම්. එස්. සි. වෙලේගම මහතා - සභාපති<br>කේ. බි. ජී. එස්. විමුක්ති මහතා<br>බි. එන්. ඩි. ගුණසේකර මහතා<br>පි. බි. ආර්. කුමාර මහතා<br>ජී. ආර්. එම්. එල්. බන්ඩාර මහතා<br>එම්. පි. ඩබ්ලිව්. කරුණාරත්න මහතා<br>එම්. ඩි. අයි. අබේගුණවර්ධන මෙනෙවිය<br>(27.07.2020 දින සිට අධ්‍යයක්ෂක ධූරය අවසන් කරන පරිදි)<br>*කේ. ඒ. සී. ප්‍රියදර්ශනි මෙනෙවිය<br>(27.07.2020 දින සිට අධ්‍යක්‍ෂක ධූරයට පත්කරන ලදි.)<br><br>**සටහන**<br>කේ. ඒ. සී. ප්‍රියදර්ශනි මෙනෙවිය වෙනුවට ඩබ්. එස්. ආර්. ජගත් කුමාර මහතා 02.03.2022 දින සිට අධ්‍යක්‍ෂක ධූරයට පත්කරන ලදි. |
| **ලේකම්වරු**<br>**(පත්කළ දිනය 2013.10.01)** | **-** | සී/ස එස් එස් පී කෝපරේට් සර්විසස් (පෞද්) සමාගම<br>අංක 101, ඇතුල් මල් පාර,<br>කොළඹ 03. |
| **විගණකවරු** | **-** | **විගණකාධිපති දෙපාර්තමේන්තුව** |

# අපගේ දැක්ම

***"තිරසාරව සංවර්ධිත සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් තුළ, පැරණි වටිනාකම් රැක ගනිමින්, වෙළඳපළ ප්‍රමුඛතම වෙළඳ සන්නාමය බවට පත් වීම"***

# අපගේ මෙහෙවර

***"තිරසාර පරිසරයක්, මූලික වටිනාකම් සහ සේවක තෘප්තිය පවත්වා ගනිමින් පාරිභෝගිකයා තෘප්තිමත් කිරීම "***

**බී.සී.සී. ලංකා ලිමිටඩ්**

**සභාපතිවරයාගේ සමාලෝචනය**

**(2021 මාර්තු මස 31වන දිනෙන් අවසන් මූදල් වර්ෂය සඳහා)**

## සභාපතිවරයාගේ ප්‍රකාශය

2021 මාර්තු මස 31වන දිනෙන් අවසන්වූ මුදල් වර්ෂය සඳහා බී සී සී ලංකා ලිමිටඩ් සමාගමෙහි වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි.

සමාගම පසුගිය වසරට සාපේක්ෂව බදු ගෙවීමෙන් පසු රුපියල් මිලියන 41.16 ක කැපී පෙනෙන ලාභයක් වාර්තා කර ඇති අතර එය 37% ක ලාභ වර්ධනයකි. ඉහත සඳහන් ලාභදායිත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා පෙර වසරට සාපේක්ෂව පරිපාලන වියදම් සහ අලෙවිකරණ සහ බෙදාහැරීමේ පිරිවැය පිළිවෙලින් රුපියල් මිලියන 14 කින් සහ රුපියල් මිලියන 3.1 කින් අඩු කිරීමට සමාගමට හැකි විය.

අඛණ්ඩව ලබාදුන් සහයෝගය සම්බන්ධයෙන් අපගේ විශ්වාසවන්ත හා කැපවූ කාර්ය මණ්ඩලය වෙත මාගේ ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමි. අපගේ කාර්ය සාධනය, ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයේ හා සමස්ථ කාර්ය මණ්ඩලයේ ස්ථිරසාර ප්‍රයත්නයෙහි ප්‍රතිඵලයයි.

කර්මාන්ත අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා සහ ලේකම්තුමාගෙන් සහ භාණ්ඩාගාරයෙන් ලැබුණු නොමසුරු සහයෝගය සහ ඥානවන්ත මගපෙන්වීම සඳහා මගේ කෘතඥතාව පුද කිරීමට කැමැත්තෙමි.

ඩබ්.එම්.එස්.සී. වෙලේගම

සභාපති

බී.සී.සී. ලංකා සමාගම

# බී.සී.සී. ලංකා සමාගම – පී.බී. 221

## සමාගමේ කටයුතු පිළිබඳව
## අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

බී.සී.සී. ලංකා සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2021 මාර්තු 31වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන, සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සමඟ වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබ ඇත.

**<u>වර්ෂයේ ප්‍රතිඵල</u>**

මුදල් වර්ෂය තුළදී මෙහෙයුම් ලාභය රු.40,280,313.00ක් විය. සමාලෝචිත මුදල් වර්ෂය තුළ සමාගම විසින් ලද මූල්‍ය ආදායම රු.3,320,554.00 විය. සමාගම විසින් රුපියල් 41,168,910.00 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත.

**<u>ප්‍රකාශිත ප්‍රාග්ධනය</u>**

සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ශ්‍රී ලංකා රුපියල් 100,000,000/-ක් වූ අතර සාමාන්‍ය කොටස් ප්‍රමාණය 10,000,000ක් වන සමාගමේ කොටස් හිමිකමෙන් 100%කම අයිතිය ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර ලේකම්වරයා විසින් දරනු ලබයි.

**<u>ගිවිසුම් පිළිබඳව අධ්‍යක්ෂකවරුන්ගේ සම්බන්ධතා</u>**

අධ්‍යක්ෂකවරුන්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 192 වැනි වගන්තියෙහි දැක්වෙන විධිවිධානවලට අනුකූලව ක්‍රියා කර ඇත.

**<u>විගණකවරුන්</u>**

ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයන්ට අනුව විගණකාධිපති දෙපාර්තමේන්තුව තවදුරටත් විගණකවරයා ලෙස කටයුතු කරනු ඇත.

**<u>සමාගම් ලේකම්වරු</u>**

එස්. එස්. පි. කෝපරේට් සේවය තවදුරටත් ලේකම්වරු ලෙස කටයුතු කරනු ඇත.

**<u>ලියාපදිංචි කාර්යාලය</u>**

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හල්ස්ඩොර්ෆ් මිල්ස්, කොළඹ 12 ස්ථානයේ පිහිටා ඇත.

| | | |
|---|---|---|
| …………………………........ | ……………………………… | …………………… |
| ඩබ්.එම්.එස්.සී. වෙලේගම මහතා | එම්. පි. ඩබ්ලිව්. කරුණාරත්න මහතා | එස්.එස්.පී. කෝපරේට් සර්විසස් (පෞද්ගලික) සමාගම |
| සභාපති | අධ්‍යක්ෂක | ලේකම්වරු |

2022.04.28

A:/d rep-21

# බී.සී.සී. ලංකා ලිමිටඩ්

බී සී සී ලංකා ලිමිටඩ් සමාගම සතු ප්‍රධාන නිෂ්පාදන පහසුකම් වනුයේ සබන් කර්මාන්ත ශාලාව සහ පොල්තෙල් පිරිපහදුවයි. මෙම යන්ත්‍රාගාර මගින් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතයන්ගේ සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ.

## 1. සබන් කර්මාන්ත ශාලාව

රෙදි සෝදන සබන්, ඇඟ ගල්වන සබන්, විෂ බීජ නාශක සහ පවිත්‍රකාරක මෙම සබන් කර්මාන්ත ශාලාවෙහි නිෂ්පාදනය කෙරේ. එම නිෂ්පාදන ඒවායෙහි වෙළඳ නාමයන් සමඟ පහත දක්වා ඇත.

1) ඇඟ ගල්වන සබන් - සඳුන්
   සුවේන්ද්‍රා මල් සුවඳැති
   සුවේන්ද්‍රා ශාකසාර
   හෙල්ත් ජෝයි
2) රෙදි සෝදන සබන් - සවරින් බාර්
   ස්නෝ-වයිට්
3) විෂබීජ නාශක - ෆයිනෝල්
   ටොයිලට් බඳුන් පිරිසිදුකාරක
4) පවිත්‍රකාරක - පිඟන් සෝදන දියර
   පිඟන් සෝදන කුඩු
   ස්නෝ-වයිට් ඩිටර්ජන්ට්
5) එයාර් ෆ්‍රෙෂ්නර්

## 2. පිරිපහදු නිෂ්පාදන

සුදු පොල් තෙල්, කුක්ස් ජෝයි යන වෙළඳ නාම යටතේ පොල් තෙල් මෙම පිරිපහදුවෙහි නිෂ්පාදනය කෙරේ. පහත සඳහන් ඇසුරුම් ප්‍රමාණයන්ගෙන් මෙම නිෂ්පාදන අලෙවි කරනු ලැබේ.

කුක්ස් ජෝයි - මිලි ලීටර් 500, ලීටර් 01, ලීටර් 5, ලීටර් 20

සුදු පොල් තෙල් - මිලි ලීටර් 500, ලීටර් 01, ලීටර් 5, ලීටර් 20

# විගණන කළමණාකරණ කමිටු වාර්තාව 2020/2021

බී සී සී ලංකා ලිමිටඩ් හි විගණන කමිටුව අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුකමිටුවක් වන අතර එය අධ්‍යක්ෂක මණ්ඩලයට සහය සපයයි. අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සහ අවදානම් සංස්කෘතියේ ව්‍යාප්තිය සහතික කරමින් සමාගමට තම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වඩාත් හොඳින් සහාය වීම සඳහා මෙම කමිටුව විසින් අවධානය යොමු කරන ලද ගැටළු සහ නිර්දේශ සහිත වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

## කාර්යභාරය සහ වගකීම්

බී සී සී ලංකා ලිමිටඩ් හි විගණන කමිටුව විෂය පථය සහ වගකීම් පාලනය වන්නේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය 55 මගිනි.

- මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවයන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයට සහාය ලබා දීම.
- ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයට සහාය ලබා දීම
- අභ්‍යන්තර විගණකවරුන්ගේ අඛණ්ඩ අපක්ෂපාතීත්වය සහ ඔවුන්ගේ සඵලතාවය සමාලෝචනය
- අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තාව සමාලෝචනය
- සමාගම නිරාවරණය වන අවදානම්, අවදානම අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඒවායේ කාර්යක්ෂමතාව සමාලෝචනය

## කමිටු සංයුතිය

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ විගණන කමිටුවේ සේවය කළ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් වූයේ කේ.ඒ.සි ප්‍රියදර්ශනි මෙනවිය (සභාපතිනිය), එම්.පි.ඩබ්.කරුණාරත්න මහතා (සාමාජික/අධ්‍යක්ෂක), කේ. බී. ජී. එස්. විමුක්ති (සාමාජික/අධ්‍යක්ෂක) ය. ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී උදේනි පෙරේරා මහත්මිය සහ කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක - බී කේ එම් ජේ රුද්‍රිගු මහත්මිය නිරීක්ෂකයින් ලෙස කමිටු රැස්වීම්වලට නියෝජනය කළහ.

## විගණන කමිටුවේ කාර්යයන්

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව, කාලය සහ පැවැත්ම සහ ව්‍යාපාර ක්‍රියාකාරීත්වයට අනුකූලව, මූල්‍ය වාර්තාකරණ ක්‍රමයේ හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් බව කමිටුව විසින් රඳවා තබා ගනී. එසේම, කමිටුව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අනුකූලතාව සහ මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා භාවිතා කරන SLFRS/LKAS ඇතුළු මූල්‍ය වාර්තාකරණ පද්ධතියට අනුකූල වීම සහතික කරයි.

තවද, පසුගිය වසර තුළ විගණන කමිටුව පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.

- සියලු වත්කම් ආරක්ෂා කිරීමට සහ මෙහෙයුම් කළමණාකරණයේ විනිවිදභාවය වැඩි දියුණු කිරීමට අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සමාලෝචනය කරන ලදී.
- විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව සහ ඒ පිළිබඳ නිරීක්ෂණ සාකච්ඡා කරන ලදී.
- වසර අවසාන මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

- වර්ෂය සඳහා වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කරන ලදී.
- සමාගම මුහුණ දෙන ප්‍රධාන උපායමාර්ගික ගැටළු සාකච්ඡා කරන ලදී.
- සබන් නිෂ්පාදන කම්හල සඳහා ක්‍රියාවලි ගිණුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදී

**රැස්වීම්**

සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ, ඉහත සඳහන් කළ පරිදි ඔවුන් වෙත පැවරී ඇති රාජකාරි පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විගණන කමිටු රැස්වීම් තුනක් (3) පවත්වා ඇත.

**නිගමනය**

විගණන කමිටුව විසින් හඳුනාගත් ගැටළු පිළිබඳ සිය අදහස් අධ්‍යක්ෂක මණ්ඩලයට සහ කළමණාකාරීත්වය වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව, ඇතැම් ගැටළු විසඳීම සඳහා අභ්‍යන්තර පරීක්ෂා කිරීම් සහ ශේෂයන් ඇතුළුව විගණන කමිටුව විසින් නිර්දේශ කරන ලද ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වේ.

**කේ.ඒ.සි ප්‍රියදර්ශනි**
**සභාපතිනිය**
**විගණන කළමණාකරණ කමිටු වාර්තාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMT/A/BCC/FA/2020/04
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2022 ජනවාරි 18 දින

සභාපති,

බී.සී.සී.ලංකා සමාගම

**බී.සී.සී.ලංකා සමාගමේ 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බී.සී.සී.ලංකා සමාගමේ 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) දේපළ පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 වන ඡේදය අනුව, වත්කම් වල ප්‍රයෝජනවත් ආයුකාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කරනු ලැබිය යුතු අතර ඵලදායී ජීව කාලය කලින් ඇස්තමේන්තු වලට වඩා වෙනස් වන්නේ



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

නම්, එම වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) අංක 8 අනුව ගිණුම්ගත කළ යුතු වුවත්, සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති දැනට භාවිතයේ පවතින පිරිවැය රු.65,050,274ක් වූ දේපළ පිරියත හා උපකරණ වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) අංක 12 හි 15 සිට 24 ඡේද ප්‍රකාරව විලම්භිත බදු වගකීම් හා විලම්භිත බදු වත්කම් හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වුවත් සමාගම විසින් ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2020/2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.
මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරණ සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2007 අංක 7 දරණ සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින්

ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති / විධානයට යොමුව** | **නිරීක්ෂණ** |
| --- | --- |
| 2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 30 | 2006 වර්ෂයේ දී සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමේදී චක්‍රලේඛය ප්‍රකාරව එක් එක් වැටුප් පියවරයන්හි පිහිටුවා වැටුප් ගෙවා තිබුණද අදාළ බඳවා ගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් මේ දක්වා අනුමත කරවාගෙන නොතිබුණි. 2021 මාර්තු 31 දිනට එහි ස්ථිර නිලධාරීන් 44 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 5 දෙනෙකු සේවයේ නියුක්තව සිටි අතර සමාලෝචිත වර්ෂය සඳහා සේවක වැටුප් හා වේතන වශයෙන් රු.29,097,372ක් හා |

මිනිස් බල සැපයුම මගින් සේවකයන් 20ත් 35ත් අතර සංඛ්‍යාවක් සමාගමේ රාජකාරි කටයුතු සඳහා අනුයුක්ත කර ඒ සඳහා රු.3,546,775ක් ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) බී.සී.සී සමාගමට අයත් අක්කර 12 රූඩ් 3 පර්චස් 8.77ක් වූ භූමි ප්‍රමාණය 2013 වර්ෂයේ දී රු.මිලියන 8,195 කට තක්සේරු කර තිබුණි. 2015 දෙසැම්බර් 17 දිනැති අංක 15/1874/702/010-VII දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් සහ 2016 අප්‍රේල් 20 දිනැති අංක 16/0597/731/009-I දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මෙම ඉඩමෙන් අක්කර 6ක බිම් කොටසක් කොළඹ අධිකරණ පියස ඉදිකිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණද, රජයේ ඉඩම් අත්පත් කර ගැනීමේ පටිපාටිය අනුව ඉඩම් පැවරීම හා වන්දි ලබා ගැනීමේ කටයුතු මේ දක්වා නිමවී නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ තක්සේරු වටිනාකම රු.මිලියන 8,195 ක් වූ මෙම භූමි භාගය තුළ වර්ග අඩි 118,345කින් යුත් ගබඩා 32ක් හා තෙල් මෙ.ටොන් 3,500ක ධාරිතාවයකින් යුතු තෙල් ටැංකි 3ක් පවතී. මෙම ගබඩා වර්ග අඩියක් රු.50 – 70ත් අතර මුදලකට කුලියට දී තිබූ අතර වර්ග අඩි 5,140ක් වූ general Stores – First floor වර්ග අඩියක් රු.30කට ලබා දී තිබුණි. ඉහල වාණිජ වටිනාකමකින් යුතු සමාගම් භූමිය තුල පවතින මෙම ගබඩා නිසි අළුත්වැඩියාවක් සිදු කර නොමැති වීමෙන් මෙසේ අඩු මුදලකට ලබා දීමට සිදුවී තිබුණි. එසේම රු.21,074,765 ක් වටිනා මෙ.ටො. 3,500 ක ධාරිතාවයෙන් යුතු තෙල් ටැංකි 3 වර්ෂ ගණනාවක සිට හිස්ව පැවති අතර එයින් ටැංකි 2ක් 2021 වර්ෂයේ මාර්තු හා ජුනි මාස වලදී කුලියට දී තිබුණි.

(ඇ) සමාගම විසින් පොල් තෙල් සැපයුම්කරුවන්ගෙන් ලබාගෙන කුඩා ටැංකි කිහිපයක ගබඩා කර තබා පෙරීමකට ලක් කර සුදු පොල් තෙල් ලෙස බෝතල් කිරීම සිදුකරනු ලබන අතර Cooks Joy තෙල් පමණක් පිරිපහදු ක්‍රියාවලියකට ලක් කරනු ලබයි. සමාලෝචිත වර්ෂයේදී මෙසේ සුදු පොල්තෙල් හා Cooks Joy තෙල් මෙ.ටොන්

311.50ක් නිෂ්පාදනය කර තිබූ අතර අතර එහි ආදායම රු.193,856,378 ක් විය. දැනට සමාගම විසින් සීමිත සැපයුම්කරුවන් කිහිප දෙනෙකුගෙන් පොල් තෙල් ලබාගෙන බෝතල් කිරීම පමණක් සිදු කරනු ලබයි. එහෙත් නිෂ්පාදනයේ මූලාරම්භය වන පොල්තෙල් නිෂ්පාදනයේ සිට අලෙවිය දක්වා දිවෙන පුළුල් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට සමාගමේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) වතුපිටිවල පිහිටා ඇති BCC සබන් නිෂ්පාදනාගාරයේ ප්‍රධාන තොග අයිතමයන් යලි ඇණවුම් මට්ටමට ලඟා වූ විට නැවත තොග ඇණවුම් කළ යුතු වුවත් සමාගම එසේ කර නොතිබුණු බැවින් 2020/2021 වර්ෂයේදී සබන් නිෂ්පාදනය වර්ෂය පුරා අඛණ්ඩව සිදු වී නොතිබුණි. තවද ආයතනයේ යන්ත්‍රවල උපරිම ධාරිතාවය අනුව නිෂ්පාදනයද සිදු වී නොතිබුණි.

සබන් නිෂ්පාදනය සඳහා අවශ්‍ය සබන් නූඩ්ල්ස් දේශීය වශයෙන් හා විදේශීය වශයෙන් සමාගම විසින් මිලදී ගෙන මිශ්‍රකර සබන් නිෂ්පාදනය කරන බැවින් ආනයන සීමා කිරීම, විදේශ නූඩ්ල්ස්වල මිල අධික වීම හේතුවෙන් 2021 මාර්තු 18 දින පවත්වන ලද ප්‍රසම්පාදන කමිටුව මගින් බාහිර පාර්ශවයෙන් සවරින් බාර් තොගයක් මිලදී ගෙන තිබුණි. බාහිර පාර්ශවයකින් මිලදී ගන්නා සබන් ආයතනයේ සන්නාමය යටතේ ඇසුරුම් කර විකිණීම පමණක් සිදු කරන අතර 2021 මාර්තු මාසයේ සිට ආයතනයේ සබන් නිෂ්පාදන යන්ත්‍ර අක්‍රියව පැවතුණි.

(ඉ) 2012 වර්ෂයේ දී බී.සී.සී ප්‍රධාන කාර්යාලයේ පැවති සබන් නිෂ්පාදන යන්ත්‍රාගාරය වතුපිටිවල ආයෝජන මණ්ඩල භූමිය වෙත ගෙන ගොස් ස්ථාපනය කර ඇතත් එය සවි කරන ලද දිනයේ සිට විගණිත දිනය වන තෙක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඊ) රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබූ හා සමාගම සතු වාහන 04ක් වර්ෂ 01-03 අතර කාල පරාසයක සිට ධාවනයට සුදුසු තත්ත්වයේ නොතිබීමෙන් සමාගම් භූමියේ වාහන අංගනයේ ගාල් කර තිබුණු අතර ඒවා එම අමාත්‍යාංශයට භාර දීමට හෝ අපහරනය කිරීමට සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

### 2.3 වෙනත් කරුණු

(අ) 2021 මාර්තු 31 දිනට ගැනුම් අත්තිකාරම් ශේෂය රු.2,503,673ක් වූ අතර එයින් වසර 11 කට වඩා පැරණි රු.1,420,474ක් වූ ශේෂයන් 32 ක් අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට කුලියට දී තිබූ ගබඩා වලින් ලැබිය යුතු කුලිය රු.14,968,317ක් වූ අතර එයින් වසර 10කට වඩා පැරණි රු.2,834,261 ක ශේෂ අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඇ) 1985, 2002 හා 2004 යන වර්ෂයන් තුල පොල් සංවර්ධන අධිකාරියෙන් රු.58,265,037 ක් හා 2003 වර්ෂයේ කළුබෝවිටියාන තේ සමාගමෙන් රු.10,000,000 ක් බැගින් ලබාගත් ණය මුදල සඳහා සමාලෝචිත වර්ෂය වන විට ගෙවිය යුතු පොලිය පිළිවෙලින් රු.53,153,819 ක් හා රු.48,382,429 ක් වූ අතර ඒ වෙනුවෙන් වාර්ෂිකව රු.6,747,521 බැගින් ගෙවිය යුතු පොලී සඳහා වෙන් කිරීම් කර තිබුණද රු.169,801,285 ක් වූ ඉතිරි ණය හා පොලී මුදල් නිරවුල් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඈ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ගෙවිය යුතු ලෙස රු.4,508,696 ක ශේෂයක් දක්වා තිබුණද ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ගිණුම් අනුව එවැනි ශේෂයක් නොපෙන්වන බැවින් මෙම ශේෂයේ නිවැරදිතාවය සම්බන්ධයෙන් විගණනයේදී තහවරුවක් ලබා ගැනීමට නොහැකි විය.

(ඉ) වර්ෂ 14කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.58,296,534ක් වූ ගෙවිය යුතු වරිපනම් බදු, පිරිවැටුම් බදු, ආරක්ෂක බදු, භාණ්ඩ හා සේවා බදු, වැට් බදු ශේෂ හා වසර 10කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.12,976,524ක ණයහිමි ශේෂ නිරවුල් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඊ) වසර 15 කට වැඩි කාලයක සිට පැවත එන ගොඩනැගිලි කුලියට දීමේදී මූලික තැන්පතු ලෙස ලබා ගන්නා ලද රු.1,949,142ක තැන්පතු නිදහස් කිරීමට හෝ අදාල තැන්පතු ඉල්ලුම් නොකරන බව තහවුරු කර ගැනීමෙන් පසු සමාගමේ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

## බී සී සී ලංකා ලිමිටඩ්

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

**2021 මාර්තු 31 න් අවසන් වසර සඳහා**

| | සටහන් | 2021<br>රුපියල්. | 2020<br>රුපියල්. |
|---|---|---|---|
| ආදායම | **04** | **305,525,059** | 251,632,204 |
| විකුණුම් පිරිවැය | **05** | **(199,894,401)** | (142,335,712) |
| **දළ ලාභය** | | **105,630,658** | 109,296,492 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | **06** | **530,937** | 369,290 |
| පරිපාලන වියදම් | **07** | **(57,449,846)** | (72,097,522) |
| බෙදා හැරීමේ පිරිවැය | **08** | **(8,431,436)** | (11,595,091) |
| **මෙහෙයුම් වලින් ලාභය** | **09** | **40,280,313** | 25,973,169 |
| මූල්‍ය ආදායම | **10** | **10,133,153** | 11,476,899 |
| මූල්‍ය පිරිවැය | **11** | **(6,812,599)** | (6,791,779) |
| **ශුද්ධ මූල්‍ය ආදායම** | | **3,320,554** | 4,685,120 |
| **බදු ගෙවීමට පෙර ලාභය** | | **43,600,867** | 30,658,289 |
| ආදායම් බදු - ආපසු හැරවීම් / (වියදම්) | **12** | **(2,431,957)** | (688,614) |
| **වසර සඳහා ලාභය** | | **41,168,910** | 29,969,675 |
| **වෙනත් විස්තීර්ණ ආදායම් / (වියදම්)** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් පිළිබඳ සත්‍ය ලාභය /(අලාභය). | **22** | **(301,870)** | 33,072 |
| **වර්ෂය සඳහා සම්පූර්ණ විස්තීරණ ආදායම /(පාඩුව).** | | **40,867,040** | **30,002,747** |
| | | - | - |

පිටු 13 සිට 24 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි .
වරහන් වල අඩු කිරීම් පෙන්නුම් කරයි .

## බී සී සී ලංකා ලිමිටඩ්

## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මාර්තු **31** වන විට

| | සටහන | **2021** | 2020 |
|---|---|---|---|
| | | රුපියල්. | රුපියල්. |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත සහ උපකරණ | **13** | **8,206,273,520** | 8,207,429,151 |
| විකිණීමට ඇති - ආයෝජන | **15** | **240,000** | 240,000 |
| | | **8,206,513,520** | 8,207,669,151 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | **16** | **49,318,418** | 27,606,607 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | **17** | **62,240,234** | 61,818,176 |
| වත්මන් බදු වත්කම් | **18** | **3,523,850** | 5,955,807 |
| මුදල් සහ මුදල් සාමානයන් | **19** | **204,753,964** | 169,041,839 |
| | | **319,836,466** | 264,422,429 |
| **මුළු වත්කම්** | | **8,526,349,986** | 8,472,091,580 |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | **20** | **100,000,000** | 100,000,000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | **21** | **8,193,775,600** | 8,193,775,600 |
| රඳවාගත් ඉපැයුම් | | **(53,703,222)** | (94,570,262) |
| **මුළු හිමිකම්** | | **8,240,072,378** | 8,199,205,338 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම | **22** | **11,718,836** | 9,857,398 |
| ණය සහ ණය ගැනීම් | **23** | **169,801,285** | 163,053,764 |
| | | **181,520,121** | 172,911,162 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | **24** | **104,757,486** | 99,975,079 |
| | | **104,757,486** | 99,975,079 |
| **මුළු වගකීම්** | | **286,277,607** | 272,886,241 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **8,526,349,986** | 8,472,091,579 |

වරහන් වල අඩු කිරීම් පෙන්නුම් කරයි

පිටුව 5 සිට 12 දක්වා සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 13 සිට 24 දක්වා මූල්‍ය ප්‍රකාශන වෙත සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇති බව සහතික කර ඇත.

**එස් එම් සී ඩබ්ලිව් රන්ජන්**
**සාමාන්‍යාධිකාරීවරයා**

අධ්‍යක්ෂක මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි. පහත පාර්ශවයන් අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අත්සන් කර ඇත.

| | |
|---|---|
| **ඩබ්ලිව්.එම්.එස්.සී වෙලේගම** | **එම්.පී.ඩබ්ලිව්. කරුණාරත්න** |
| **සහපති / අධ්‍යක්ෂක** | **අධ්‍යක්ෂක** |

කොළඹ.
දිනය: .....................

## බී සී සී ලංකා ලිමිටඩ්

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

**2021 මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා**

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල්. | ප්‍රත්‍යාගණන සංචිතය රුපියල්. | රඳවාගත් ඉපැයුම් රුපියල්. | එකතුව රුපියල්. |
|---|---|---|---|---|
| **2019 අප්‍රේල් 1 වන දිනට ශේෂය** | 100,000,000 | 8,193,775,600 | (124,573,008) | 8,169,202,592 |
| වසර සඳහා ලාභය | - | - | 29,969,674 | 29,969,674 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | 33,072 | 33,072 |
| **2020 අප්‍රේල් 1 වන දිනට ශේෂය** | **100,000,000** | **8,193,775,600** | **(94,570,262)** | **8,199,205,338** |
| වසර සඳහා ලාභය | **-** | **-** | 41,168,910 | 41,168,910 |
| වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්) | | | (301,870) | (301,870) |
| **ශේෂය 2021 මාර්තු 31 දිනට** | **100,000,000** | **8,193,775,600** | **(53,703,222)** | **8,240,072,378** |

වරහන් වල අඩු කිරීම් පෙන්නුම් කරයි

පිටුව 5 සිට 12 දක්වා සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 13 සිට 24 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

# බී සී සී ලංකා ලිමිටඩ්

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා

| | සටහන | 2021<br>රුපියල්. | 2020<br>රුපියල්. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | | |
| බදු ගෙවීමට පෙර ලාභය/(අලාභය). | | **43,600,867** | 30,658,288 |
| **ගැලපීම්** | | | |
| ක්ෂය වීම් | **13** | **2,711,855** | 3,294,180 |
| ක්‍රමක්ෂ කිරීම | **14** | **-** | 1,924,992 |
| පොලී ආදායම | **10** | **(10,133,153)** | (11,476,899) |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සඳහා ප්‍රතිපාදන වැඩි කිරීම | **22** | **1,985,617** | 1,986,114 |
| පොලී පිරිවැය | **11** | **6,747,521** | 6,747,521 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය).** | | **44,912,708** | 33,134,196 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් :** | | | |
| භාණ්ඩ තොග වැඩි වීම | **16** | **(21,711,811)** | 9,665,006 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේවල වැඩි වීම / අඩුවීම | **17** | **(422,058)** | (6,966,214) |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු මුදල් වැඩි කිරීම /(අඩුවීම). | **19** | **4,782,410** | 2,029,149 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන මුදල්** | | **27,561,248** | 37,862,137 |
| විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා ඇත | **22** | **(426,050)** | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද /( ඒ සඳහා යොදවන ලද) ශුද්ධ මුදල්** | | **27,135,198** | 37,862,137 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | | |
| දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | **13** | **(1,556,226)** | (4,156,197) |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම | | **-** | - |
| ලද පොලිය | **10** | **10,133,153** | 11,476,899 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද /(ඒ සඳහා යොදවන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **8,576,927** | 7,320,702 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | | |
| ESC ගෙවූ | **18** | **-** | (688,614) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල ලද /(ඒ සඳහා යොදවන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **-** | **(688,614)** |
| **මුදල් සහ මුදල් සාමාන්‍යයන්හි ශුද්ධ වැඩිවීම /(අඩුවීම).** | | **35,712,125** | 44,494,225 |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සාමාන්‍යයන් | | **169,041,839** | 124,547,614 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සාමාන්‍යයන්** | | **204,753,964** | 169,041,839 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සාමාන්‍යයන් විශ්ලේෂණය** | | | |
| මහජන බැංකුව | 19 | **28,555,689** | 34,777,663 |
| අතැති මුදල් | 19 | **217,000** | 132,073 |
| කෙටි කාලීන ආයෝජන - මහජන බැංකුව | 19 | **175,981,274** | 134,132,103 |
| | | **204,753,964** | 169,041,839 |

වරහන් වල අඩු කිරීම් පෙන්නුම් කරයි

පිටුව 5 සිට 12 දක්වා සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 13 සිට 24 දක්වා මූල්‍ය ප්‍රකාශන වෙත සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ .

## 1. ආයතනික තොරතුරු

### 1.1 ලියාපදිංචිය සහ නෛතික තත්ත්වය

බීසීසී ලංකා සමාගම, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කොට සංස්ථාගත කොට ඇති සීමාසහිත වගකීමැති සමාගමකි. ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තේ කොළඹ 12, මිරාණියා වීදිය, හල්ස්ඩොර්ෆ් මිල්ස් යන ස්ථානයේය.

### 1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සිදුකරන ලද ප්‍රධාන කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

- පොල්තෙල් වෙළඳාම
- ඇඟ ගල්වන සබන්, රෙදි සෝදන සබන්, විෂබීජ නාශක පිරිසිදුකාරක සහ ඩිටර්ජන්ට් නිෂ්පාදනය කිරීම සහ වෙළඳාම
- ගොඩනැගිලි කුලියට දීම

## 2 සකස්කිරීමේ පදනම

### 2.1 අනුකූලත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් දැ හැර 2021 මාර්තු 31වන දිනට සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමඟ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම්වල වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLRFS හා LKAS) හා වරලත් ගණකාධිකාරි ආයතනයේ නියමයන්ට හා 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

### 2.2 අගය කිරීමේ පදනම

අන්‍යාකාරයකින් සඳහන් කොට නොමැත්තේ නම්, ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කොට ඇති මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කොට ඇත්තේ උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය නියමයට අනුකූලවය.

### 2.3 සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් යොදාගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති, අන්‍යාකාරයකින් සඳහන් කොට නොමැත්තේ නම්, පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුරූපී වේ. පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය තැන්හිදී, පෙර වර්ෂවල සංඛ්‍යා සහ වාක්‍ය සටහන් නැවත පිළියෙල කරනු ලැබ ඇත.

### 2.4 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙන් පසුව හටගත් සිද්ධීන්

සියලුම භෞතික සිද්ධීන් සළකා බලනු ලැබ ඇති අතර, මෙම මූල්‍ය ප්‍රකාශවල ඒ සඳහා සුදුසු ගැලපීම් සහ අනාවරණය කිරීම් සිදුකර ඇත.

### 2.5 භාවිත හා පිළිගැන්වීමේ මුදල් ඒකකය

සියලු මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා රුපියල් මගින් ඉදිරිපත් කර ඇත. සමාගමේ ගණුදෙනු කරන හා වාර්තා ඉදිරිපත් කරන මුදල් ඒකකය රුපියල් වේ. අන්‍යාකාරයකින් සඳහන් කර නොමැති විට සියලුම මූල්‍ය වාර්තා ආසන්න රුපියලට වටයා ඇත.

### 2.6 ප්‍රමාණාත්මකභාවය හා සමාහරණය

සමාන අයිතමවල සෑම ද්‍රව්‍ය පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත.ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 01 - “මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම” මගින් අවසර දී ඇති පරිදි ද්‍රව්‍යමය නොවන නම් මිස ස්වභාවයට හෝ ක්‍රියාකාරීත්වයෙන් වෙනස් අයිතම වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

### 2.7 මූල්‍ය වාර්තා අනුමැතිය

2021 දෙසැම්බර් XX දින අධ්‍යක්‍ෂක මණ්ඩල යෝජනාවට අනුව 2021.03.31 දිනෙන් අවසන් වසර සඳහා පිළියෙල කල මූල්‍ය වාර්තා ප්‍රසිද්ධ කිරීමට අනුමැතිය හා බලය ලබා දි ඇත.

### 2.8 මූල්‍ය වාර්තා පිළිබඳ වගකීම

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව මූල්‍ය වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරිම අධ්‍යක්‍ෂක මණ්ඩලය සතු වගකීමකි.

අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් එම වගකීම් පිළිගන්නා අතර එම වගකීම් තුල පහත සඳහන් දෑ ඇතුලත් වේ.

- වසර අවසාන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු
- මුදල් හා මුදල් වලට සමාන දෑ වල වෙනස්වීම පිළිබඳ තොරතුරු
- ප්‍රතිපත්ති හා පැහැදිලි කිරීම් සමඟ මූල්‍ය ප්‍රකාශ වලට අදාළ සටහන්

### 2.9 තක්සේරුව හා විනිශ්චය භාවිතය

SLFRS හා LKAS වලට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී කළමණාකාරීත්වයට විවිධ උපකල්පන, නිගමන හා තක්සේරු කිරීම් වලට එළඹීමට සිදුවන අතර මෙමගින් වාර්තා කරන ලද වත්කම්, වගකිම්, ආදායම්, වියදම් හා ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට බලපෑමක් ඇතිවිය හැක. සත්‍යය අගයන් වාර්තාගත අගයන්ට වඩා වෙනස් විය හැක.

තක්සේරු කිරීම් හා උපකල්පන කාලානුරූපීව නැවත පරීක්ෂා කරනු ලැබේ. ගිණුම්කරණ තක්සේරු සංශෝධනයන්, අදාළ කාලපරිච්ඡේදයට සහ අදාළ සංශෝධනයන් බලපානු ලබන ඉදිරි වසර වලටද අදාළ වන පරිදි ගලපනු ලැබේ.

මූල්‍ය වාර්තා තුල හඳුනා ගනු ලබන අතිශය වැදගත් වටිනාකම් වලට අදාළ තක්සේරු කිරීම්, උපකල්පන හා තීන්දු වෙනමම සටහන් මගින් පහත අයිතම යටතේ දක්වා ඇත.

- සේවක විශ්‍රාම ප්‍රතිලාභ සටහන්
- දේපල, පිරියත හා උපකරණ ක්ෂය කිරිම්
- කපාහැරීම් වලට අදාළ වෙන් කිරිම්

## 2.10 අඛණ්ඩ පැවැත්ම

කළමණාකාරීත්වය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ඇගයීමක් කර ඇති අතර ආයතනය සතු සම්පත් දැකිය හැකි අනාගතයක් දක්වා ව්‍යාපාර කටයුතු කිරීමට ප්‍රමාණවත් වීම ගැන තෘප්තිමත්ය. තවද අඛණ්ඩ පැවැත්මට පටහැනි අවිනිශ්චිතතාවයන් පිළිබඳව කළමණාකාරීත්වය දැනුවත් නොමැති බැවින් සමාගමේ ගිණුම් අඛණ්ඩ පැවැත්ම මත පිහිටා තවදුරටත් පිළියෙල කර ඇත.

## 2.11 වාර්තා කරන දිනට පසු සිදුවීම්

මූල්‍ය වාර්තා සකස් කරන දිනයන් හා අනුමත කරනු ලබන දිනයන් අතර සිදුවන වාසිදායක හා අවාසිදායක සිදුවීම මූල්‍ය වාර්තා වලට පසු සිදුවීම් වේ. මූල්‍ය වාර්තා වලට පසු සියලුම භෞතික හා වැදගත් සිදුවීම් සලකා බලා අදාළ හෙළිදරව් කිරීම් කර ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

අන්‍යාකාරයකින් සඳහන් කර නොමැති විට හැරුනුකොට සමාගම විසින් පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව අනුගමනය කර ඇත.

## 3.1 දේපළ, පිරියත සහ උපකරණ

### 3.1.1 පිරිවැය

දේපල, පිරියත සහ උපකරණ සඳහා එකතු කරන ලද ක්ෂයවීම් හා එකතු වූ දුර්වලතා අලාභයන් සඳහා අඩු කිරීම් කර පිරිවැයට දක්වා ඇත. දේපල, පිරියත සහ උපකරණ වල සියළුම අයිතමයන් මුල් මිල ගණන් යටතේ සටහන් වේ.
දේපල, පිරියත සහ උපකරණ වල පිරිවැය යනු අත්පත් කර ගැනීම හෝ ඉදිකිරීමේ පිරිවැය සහ වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා එහි තත්ත්වයට ගෙන ඒම සඳහා වන ඕනෑම වියදමක් සමඟ ය.

### 3.1.2 පසු පිරිවැය

දේපල, පිරියත සහ උපකරණවල යම් අංගයක් ආදේශ කිරීමේ පිරිවැය පසුව එම කොටස තුළ ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒමට ඉඩ තිබේ නම් සහ එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැන ගත හැකි නම් අයිතමයේ රැගෙන යන ප්‍රමාණයෙන් පිළිගනු ඇත. දේපල, පිරියත සහ උපකරණ සඳහා එදිනෙදා සේවා පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අය කෙරේ.

### 3.1.3 ක්ෂය වීම්

සරල රේඛීය ක්‍රමය භාවිතා කරමින් වත්කම්වල ක්ෂය කළ හැකි අගය (සින්නක්කර ඉඩම් හැර) ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට කපා හැරීම සඳහා ක්ෂයවීම් ලාභයට හෝ අලාභයට අය කෙරේ. ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය, අවශේෂ අගයන් සහ ක්ෂයවීම් ක්‍රමය සෑම වසරකම සමාලෝචනය කරනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ සඳහා ඇස්තමේන්තු කර ඇති ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ;

| ස්පෘශ්‍ය වත්කම් පන්තිය | ප්‍රයෝජනවත් ජීවිත කාලය |
|---|---|
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | අවුරුදු 10 |
| ගොඩනැගිලි | අවුරුදු 20 |
| මෙවලම් සහ උපකරණ | අවුරුදු 04 |
| මෝටර් රථය | අවුරුදු 04 |
| කාර්යාල උපකරණ | අවුරුදු 04 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | අවුරුදු 04 |

වත්කමක ක්ෂය වීම එය භාවිතය සඳහා ලබා ගත හැකි වූ විට ආරම්භ වන අතර වත්කම විකිණීම සඳහා හිමි යැයි වර්ගීකරණය කළ දිනට පෙර සහ වත්කම අවලංගු කළ දින සිට නැවැත්වේ. ක්ෂයවීම් ක්‍රම, ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ අවශේෂ අගයන් එක් එක් වාර්තා කිරීමේ දිනයේදී සමාලෝචනය කර සුදුසු නම් සංශෝධනය කරනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණවල වාර්ෂික ක්ෂයවීම නිෂ්පාදන හා සේවා අංශවලට පහත සඳහන් අනුපාතවලට බෙදීමට සමාගම තීරණය කරයි.

| ස්ථාවර වත්කම් පන්තිය | නිෂ්පාදන අංශය | සේවා අංශය |
|---|---|---|
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 70% | 30% |
| ගොඩනැගිලි | 40% | 60% |
| මෙවලම් සහ උපකරණ | 30% | 70% |
| මෝටර් වාහන | - | 100% |
| කාර්යාල උපකරණ | - | 100% |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | - | 100% |

### 3.1.4 ණයට ගැනීමේ පිරිවැය

